ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 1883/17 - 2014 ඔක්තෝබර් මස 11 වැනි සෙනසුරාදා - 2014.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1991.05.17 දිනැති අංක 662/11 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද සෞඛ්‍ය යේ වෛද්‍ය පිරිස් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන ප්‍රකාර ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා දැනස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි, පහත දැක්වෙන ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ටී.එම්.එල්.සී සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඔක්තෝබර් මස 10 දින.

### ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය

01. ක්‍රියාත්මක වන දිනය
මෙම වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2013-11-01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

02. පත්කිරීමේ බලධරයා .
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් තනතුර සඳහා පත්කිරීම් බලධරයා අමාත්‍ය මණ්ඩලය වන අතර අනෙකුත් සියළුම තනතුරු සඳහා පත්කිරීම් බලධරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

03 සේවා ගණය/ සේවා ගණ .

3.1 සේවා ගණ -SL - 03 - 2006 වැටුප් කේත අයත් සේවා ගණය
SL - 01 - 2006 වැටුප් කේත අයත් සේවා ගණය
SL - 02 - 2006 වැටුප් කේත අයත් සේවා ගණය

3.2 ශ්‍රේණි
SL - 03- 2006 වැටුප් කේත අයත් සේවා ගණය
නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් ශ්‍රේණිය
විශේෂඥ වෛද්‍ය නිලධාරී ශ්‍රේණිය

SL- 01- 2006 වැටුප් කේත අයත් සේවා ගණය
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය
නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය

SL- 02- 2006 වැටුප් කේත අයත් සේවා ගණය
වෛද්‍ය නිලධාරී I ශ්‍රේණිය
වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය
වෛද්‍ය නිලධාරී ප්‍රාථමික ශ්‍රේණිය

දන්ත වෛද්‍ය නිලධාරීන් I ශ්‍රේණිය
දන්ත වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණිය

04. වෛද්‍ය සේවයේ කාර්යභාරය :

දීප ව්‍යාප්ත සේවාවක් වන ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවයට අයත් මෙම සේවා ව්‍යවස්ථාව මගින් පාලනය වි නිලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වන පොදු පරිපාලනය (සෞඛ්‍ය අමාත්‍යාංශය, විමධ්‍යගත ඒකක), රෝගී සත්කා සේවා (ප්‍රතිකාරක සේවා), මහජන සෞඛ්‍ය සේවා (නිවාරණ සේවා) යන සේවා වන් හා බැඳී සිටින අතර මෙම නිලධා රෝගී සත්කාරක සේවා සැලසීම සෞඛ්‍ය සේවා සම්පාදනය සම්බන්ධයෙන් වගකිව යුතුය. ජනතාවගේ ශාරීරික, මාන හා සමාජ යන පැවැත්ම කතවුරු කිරීමේ අරමුණින් අවශ්‍ය අවස්ථාවන්හි දී විශේෂඥ සේවාවන් ද සහිතව සෞඛ්‍යසංරක්ෂණ ප්‍රතිකාරක (රෝග විනිශ්චය හා චිකිත්සා) නිවාරණ, ප්‍රවර්ධනාත්මක (promotive) හා පුනරුත්ථාපන පාර්ශවයන්හි සම පරාසයම මෙම සේවා මගින් ආවරණය කෙරේ. තවද උක්ත සඳහන් කාර්යයන්ට අමතරව අධ්‍යාපනය, පුහුණු, පර්යේෂ අධිකරණමය කටයුතු එමෙන්ම වෛද්‍ය සේවා සම්බන්ධව අධීක්ෂණය හා ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදනය, සම සෞඛ්‍ය සේවා කළමනාකරණය ඇතුළුව ඉහත සඳහන් සියළුම සේවා අංශවල සියළු පොදු පරිපාලන කටයුතු සම්බන්ධයෙ ද ඔවුන් බැඳී සිටී.

05. වැටුප්

| සේවා ගණය | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|---|---|---|
| SL - 03 - 2006 වැටුප් කේත අයත් සේවා ගණය | SL - 03 | 42,390-12 x 1,310 - 58,110 | නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් | 01 | 42,390 |
| | | | විශේෂඥ වෛද්‍ය නිලධාරී/ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධාරී | 01 | 42,390 |
| SL - 01 - 2006 වැටුප් කේත අයත් සේවා ගණය | SL - 01 | 22,935-10 x 645 - 8x790- 17x1,050- 53,555/- | ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන | 20 | 36,755 |
| | | | නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන | 12 | 30,175 |
| SL - 02 - 2006 වැටුප් කේත අයත් සේවා ගණය | SL - 02 | 25,515- 4x645- 8x650- 16x1,050- 50,095/- | වෛද්‍ය නිලධාරී I | 14 | 34,345 |
| | | | වෛද්‍ය නිලධාරී II | 5 | 28,095 |
| | | | වෛද්‍ය නිලධාරී - ප්‍රාථමික | 2 | 26,160 |
| | | | දන්ත වෛද්‍ය නිලධාරී I | 14 | 34,345 |
| | | | දන්ත වෛද්‍ය නිලධාරී II | 1 | 25,515 |

06 සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත ශ්‍රේණි, තනතුරු - නාම හා සංඛ්‍යාව

| තනතුරු අනුමත ශ්‍රේණි | තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය | අතිරේක ලේකම්( වෛද්‍ය සේවා ) | 1 |
| | අතිරේක ලේකම්( මහජන සෞඛ්‍ය සේවා) | 1 |
| | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් | 8 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් /ශ්‍රී.ලංකා.ජා.රෝ. | 1 |
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වෛද්‍ය සේවා | 112 |
| | අධ්‍යක්ෂවරුන් (අමාත්‍යාංශය / රෝහල් / වැඩසටහන්) | |
| | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් | |
| | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් | |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / ශ්‍රී ලංකා .ජා.රෝ | |
| | පළාත් සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් | |
| නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය | නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (අමාත්‍යාංශය/රෝහල/වැඩසටහන්) | 174 |
| | නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් | |
| | වෛද්‍ය අධිකාරීවරුන්<br>නියෝජ්‍ය වෛද්‍ය අධිකාරීවරුන් | |
| විශේෂඥ වෛද්‍ය ශ්‍රේණිය | විශේෂඥ වෛද්‍ය නිලධාරීන් | 1699 |
| | විශේෂඥ දන්ත වෛද්‍ය නිලධාරීන් | 88 |
| වෛද්‍ය නිලධාරී I ශ්‍රේණිය | වෛද්‍ය නිලධාරීන් (අමාත්‍යාංශය/රෝහල/වැඩසටහන්) | 15052 |
| වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය | | |
| වෛද්‍ය නිලධාරී ප්‍රාරම්භක ශ්‍රේණිය | | |
| දන්ත වෛද්‍ය නිලධාරීන් ශ්‍රේණිය I | දන්ත වෛද්‍ය නිලධාරීන් (අමාත්‍යාංශය/රෝහල/වැඩසටහන්) | 1371 |
| දන්ත වෛද්‍ය නිලධාරීන් ශ්‍රේණිය II | | |

6.2 තනතුරේ ස්වභාවය

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

07. බඳවා ගැනීම් ක්‍රමය

7.1 බඳවා ගැනීම් අනුපාතය

100% විවෘත ධාරාව යටතේ බඳවා ගනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

අ-වෛද්‍ය නිලධාරීන්
ආ-දන්ත වෛද්‍ය නිලධාරීන්

7.2.අ- විවෘත බඳවා ගැනීම - වෛද්‍ය නිලධාරීන්

7.2.අ- 1 බඳවා ගැනීම් ශ්‍රේණිය-ප්‍රාථමික ශ්‍රේණිය

7.2.අ- 2 බඳවා ගැනීම් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙහි අනුමත කරන ලද පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයක හෝ විදේශීය විශ්වවිද්‍යාලයක වෛද
පීඨයක වෛද්‍ය උපාධිය ලැබ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලබන රෝහලක වසරක අනිවාර්ය සීමාවාසි
පුහුණුව සාර්ථක ලෙස නිමකරන ලදුව වෛද්‍යවරයෙකු ලෙස සේවාව කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාෙ
පූර්ණ ලියාපදිංචිය ලැබූ වෛද්‍ය නිලධාරීහු බඳවා ගැනීම් සඳහා සුදුසුකම් ලබති.

සටහන 1-

1988 නොවැම්බර් 1 දිනට පසුව විදේශ වෛද්‍ය උපාධි ලැබූ ශ්‍රී ලංකා පුරවැසියන් සඳහා වෛද්‍ය ආඥා පනතේ 29.1(b) (I
(cc) සහ 29.2 (b) (III) යටතේ විශේෂ විභාගය සමත්ව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලබන රෝහලක එක් වසර
අනිවාර්ය සීමාවාසික පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.අ- 3 ශාරීරික යෝග්‍යතාවය : රෝගී සත්කාරක සේවා ඉටු කිරීම සඳහා යෝග්‍ය වන ශාරීරික තත්ත්වයන්

7.2.අ- 4 වයස : අවු : 25-45 අතර.

7.2.අ- 5 බඳවා ගැනීම අයදුම්පත් කැඳවීම හා තෝරා ගැනීමේ ක්‍රමවේදය :
බඳවා ගැනීම අයදුම්පත් කැඳවීම හා තෝරා ගැනීමේ ... සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළකරනු ල
දෙපාර්තමේන්තු චක්‍රලේඛයකින් හා රජයේ ගැසට් පත්‍රයේ හා සෞඛ්‍ය අමාත්‍යාංශ ... අයදුම්පත් කැඳවනු ලැබේ. පළමු ප්‍රමුඛ
ප්‍රසිද්ධ දැන්වීමක් මගින් ඉහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ... ඉන් අනතුරුව වෛද්‍ය ආඥා පනතේ 29.1 (b) (II)
සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන් සළකා බැලෙන අතර ඉන් අනතුරුව වෛද්‍ය ආඥා පනතේ 29.1 (b) (II) ... සුදුසුකම් ලත් විදෙස් විශ්වවිද්‍යාල උපාධිධාරීන් සළ
සහ 29.2 (b) (III) වගන්ති යටතේ වන විශේෂ විභාගය සමඟ සුදුසුකම් ලත් විදෙස් විශ්වවිද්‍යාල උපාධිධාරීන් සළ
බලනු ලැබේ. තෝරා ගැනීම කරනු ලබනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සපයනු ලබන ර
විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල හා විදෙස් විශ්වවිද්‍යාල උපාධිධාරීන් සම්බන්ධයෙන් ශ්‍රී ල
වෛද්‍ය සභාව විසින් සපයනු ලබන කුසලතා අනුපිළිවෙල අනුවය. රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය සහ
ඔවුන් වෛද්‍ය නිලධාරීන් ලෙස ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

7.2 (ආ) විවෘත බඳවා ගැනීම - දන්ත වෛද්‍ය නිලධාරීන්
7.2. (ආ) 1. බඳවා ගැනීමේ ශ්‍රේණිය-ශ්‍රේණිය II

7.2.(ආ) 2. බඳවා ගැනීමේ සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙහි අනුමත කරන ලද පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයක හෝ විදේශීය විශ්වවිද්‍යාලයක
වෛද්‍ය පීඨයක දන්ත වෛද්‍ය උපාධිය ලැබ දන්ත වෛද්‍යවරයෙකු ලෙස සේවාව කිරීම සඳහා ශ්‍රී ලංකා වෛ
සභාවේ පූර්ණ ලියාපදිංචිය ලැබූ දන්ත වෛද්‍ය නිලධාරීහු බඳවා ගැනීම් සඳහා සුදුසුකම් ලබති.

සටහන 2-

1988 නොවැම්බර් 1 දිනට පසුව විදේශ දන්ත වෛද්‍ය උපාධි ලැබ ශ්‍රී ලංකා පුරවැසියන් සඳහා වන වෛද්‍ය ආඥා පනතේ 29.1(b) (II) (cc) සහ 29.2 (b) (III) යටතේ විශේෂ විභාගය සමත්ව තිබිය යුතුය.

7.2.(ආ) 3.පළපුරුද්ද: අදාළ නොවේ

7.2.(ආ) 4 ශාරීරික යෝග්‍යතාවය : රෝගී සත්කාරක සේවා ඉටු කිරීම සඳහා යෝග්‍ය වන ශාරීරික තත්වයන්.

7.2.(ආ) 5 වයස : අවු : 25-45 අතර

7.2.(ආ) 6 බඳවා ගැනීම අයදුම්පත් කැඳවීම හා තෝරා ගැනීමේ ක්‍රමවේදය

දෙපාර්තමේන්තු චක්‍රලේඛයකින් හා රජයේ ගැසට් පත්‍රයේ හා සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළකරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් ඉහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පළමු ප්‍රමුඛතාව සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන් සළකා බැලෙන අතර ඉන් අනතුරුව වෛද්‍ය ආඥා පනතේ 29.1 (b) (II) (cc) සහ 29.2 (b) (III) වගන්ති යටතේ වන විශේෂ විභාගය සමඟ සුදුසුකම් ලත් විදෙස් විශ්වවිද්‍යාල උපාධිධාරීන් සළකා බලනු ලැබේ. තෝරා ගැනීම කරනු ලබනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සපයනු ලබන රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල හා විදෙස් විශ්වවිද්‍යාල උපාධිධාරීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සපයනු ලබන කුසලතා අනුපිළිවෙල අනුවය. රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය සහිතව ඔවුන් දන්ත වෛද්‍ය නිලධාරීන් ලෙස දෙවන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

සටහන 3-

විදේශ වෛද්‍ය උපාධිය/ දන්ත වෛද්‍ය උපාධිය සමඟ වන අධ්‍යාපන සුදුසුකම පිළිගනු ලබන්නේ පහත කොන්දේසිවලට යටත්වය.

- x අදාළ උපාධිය පෙර දී අනුමත කර නොමැත්තේ නම් එය විදේශ උපාධි කමිටුවට යොමු කළ යුතුය.
- x ඉංග්‍රීසි භාෂාව නොවන අන් භාෂාවකින් සිය පාඨමාලාව හදාරා ඇති උපාධිධාරීන් සිව් මසක භාෂා හුරු කිරීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුය. (වෛද්‍ය උපාධිධාරීන් සෑම ප්‍රධාන විශේෂඥතාවයක් පිළිබඳව මාසය බැගින්)

සීමාවාසික වෛද්‍ය නිලධාරීන්

විදේශ උපාධි සුදුසුකම් සහිත අපේක්ෂකයන්ගේ සීමාවාසික පත්වීමේ ආරම්භය ශ්‍රී ලංකා වෛද්‍ය පීඨයන්ගෙන් පැමිණි සීමාවාසිකයන්ගේ පත්වීම් සමඟ එක විට සිදු වීම සිදුවිය යුතුය.

8. වෛද්‍ය නිලධාරීන් හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග ක්‍රමවේදය.

8.1 කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ ස්වභාවය | විෂයන් | විශේෂ අවධානය යොමුකිරීමට උපදෙස් දෙනු ලබන ක්ෂේත්‍ර |
|---|---|---|---|
| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | අ. ලිඛිත විභාගය | (අ.) ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍රයන් පහත පරිදි වේ.<br><br>1. ආයතන සංග්‍රහය -පැය දෙකක ප්‍රශ්න පත්‍රය<br><br>2. ගිණුම් - පැය දෙකක ප්‍රශ්න පත්‍රය | සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි.<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි.<br><br>ආයතන සංග්‍රහය<br><br>සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණ හා ගිණුම්කරණ රෙගුලාසි. |

| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ ස්වභාවය | විෂයන් | විශේෂ අවධානය යොමුකිරීමට උපදෙස් දෙනු ලබන ක්ෂේත්‍ර |
|---|---|---|---|
| | | 3. රෝහල් හා බෙහෙත් ශාලා පරිපාලනය - පැය එකහමාරක ප්‍රශ්න පත්‍රය | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස<br>දෛනික පරිපාලන රාජකාරී සඳහා අදාළ වන මූල්‍ය රෙගුලාසි.<br>රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය |
| | ආ. වාචික පරීක්ෂණය | (ආ.) වාචික පරීක්ෂණය - සිංහල/දෙමළ භාෂා ප්‍රවීණතාවය සඳහා වේ. | අමාත්‍යාංශ විභාග දැන්වීමෙහි සඳහන් අදාළ පරිච්ඡේද |

8.2 කාර්යක්ෂමතා කඩඉම් ඉක්මවනුයේ වසර කීයකට පසුවද :

ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගනු ලබන සියළුම වෛද්‍ය නිලධාරින් සේවයෙහි II ශ්‍රේණියට උසස් කරනු ලැබීමට ෙ
හා II ශ්‍රේණියට බඳවා ගනු ලබන සියළුම දන්ත වෛද්‍ය නිලධාරීන් පත්වීම් දින සිට වසර තුනක් තුළ කර්යක්ෂම
කඩඉම් විභාගය සමත් විය යුතු ය.

8.3 කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පරිපාලන බල
පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක හෝ පරීක්ෂ
මණ්ඩලයක් විසින්

සටහන 4-

කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන පොදු මාර්ගෝපදේශ.

x විභාගය පවත්වනු ලබන දිනට මසකට පෙර රජයේ ගැසට් පත්‍රයෙහි විභාග නිවේදනය පළ කරනු ලැබේ.

x සිය සේවා කාලයෙහි ප්‍රමාණය නොසළකා ප්‍රාථමික ශ්‍රේණියේ ඉන්නා කවර නිලධාරියෙකුට වුව ද කාර්යක්ෂමතා කඩ
විභාගයට පෙනී සිටීම සඳහා අයදුම් කළ හැක.

x නිලධාරින් විභාගයට පෙනී සිටිනා ප්‍රථම අවස්ථාවේ දී සියළුම විෂයන්ට අනිවාර්යයෙන්ම පෙනී සිටිය යුතුය. නිලධා
විෂයන් එකක් හෝ වැඩි ගණනක් සමත්ව අනෙක් විෂයන් අසමත් වන්නේ නම් ඔහු හෝ ඇය පසු අවස්ථාවක විභාග
පෙනී සිටිමින් අසමත් වූ විෂය/විෂයන් සමත්වීම අවශ්‍ය වේ.

x වසර දෙකක කාලයක් තුළ දෙපාර්තමේන්තු විභාගය සමත් නොවන වෛද්‍ය නිලධාරීන්ගේ /දන්ත වෛද්‍ය නිලධාරීන්
වැටුප් වර්ධක විලම්භනය කරනු ලබන අතර ඔහු / ඇයගේ අදාළ ශ්‍රේණියට වන උසස් වීම විභාගය සමත් වීම සඳහා ව
දෙකකට අමතරව ගනු ලැබූ කාලයට සමාන කාලයකින් පමා කරනු ලැබේ.

x එකී දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් වන තුරු II ශ්‍රේණියට උසස් වීම, විශේෂඥ ශ්‍රේණියට හෝ පරිපාලන ශ්‍රේණි
පත්වීම සඳහා අවසර නොලැබේ.

x පූර්වයෙහි දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් නොවූ වෛද්‍ය නිලධාරීන් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛ
ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් ඔවුන් පත්වීම් දින සිට දෙවසරක කාලයක් තුළ දෙපාර්තමේන්තු පරීක්ෂ
සමත්වීම අවශ්‍ය වේ. සිය දෙවන වැටුප් වර්ධකය විලම්භනය කිරීමට අමතරව නියම කරනු ලබන කාලය තුළ එසේ කිරී
අසමත් වන්නන්ගේ ජ්‍යෙෂ්ඨත්වය විභාගය සමත්වීම සඳහා ගනු ලැබූ අමතර කාලයට සමාන කාලයකින් පමා කරනු ලැ

x ආයතන සංග්‍රහය, ගිණුම්, රෝහල් හා බෙහෙත් ශාලා පරිපාලනය යන විෂයයන්ගෙන් සමන්විත ලිඛිත විභාගයක්ද ස
සිංහල/දෙමළ භාෂා ප්‍රවීණතාව මැන බැලීම සඳහා වන වාචික පරීක්ෂණයක්ද වේ. වාචික පරීක්ෂණය පැවැත්වීමේ අර

වනුයේ සිය සාමාන්‍ය රාජකාරි ඉටුකිරීමේලා පැන නැගෙන කරුණු සම්බන්ධයෙන් ඉහත කවර භාෂාවකින් වුව වතුර ලෙස අදහස් හුවමාරු කර ගැනීමට නිලධාරීන්ට හැකිදැයි පරීක්ෂා කිරීමය.

x මෙම විභාගය වසරකට දෙවරක් පැවැත් වේ.

9. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

| භාෂා ප්‍රවීණතාව | අත් කරගත යුතු ප්‍රවීණතා |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය. අ.පො.ස (සා/පෙ) මවු බස සඳහා සාමාර්ථ සුදුසුකමක් ලබා තිබීම මේ සඳහා ප්‍රමාණවත් වේ. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව ආදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් වීම්

10.1 වෛද්‍ය නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් වීම් .

10.1.1 ප්‍රාථමික ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.
සපුරාලිය යුතු සුදුසුකම්.

I. ප්‍රාථමික ශ්‍රේණියේ වසර දෙක (02) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.1.2.1 පශ්චාත් උපාධි/ඩිප්ලෝමා සහිත වෛද්‍ය නිලධාරීන් උසස් කිරීම

සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවය ස්ථිර කර තිබීම
II. සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත කාලය තුළදී වැටුප් වර්ධක හයක් (06) ක් උපයාගෙන තිබීම.
III. පූර්වාසන්න වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. සේවා ව්‍යවස්ථාවේ I හා II පරිශිෂ්ඨයේ සඳහන් සුදුසුකම් ; පශ්චාත් උපාධි සුදුසුකම් සාර්ථකව සපුරා තිබීම
V. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම
VI. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළදී ලබා ගෙන තිබීම

10.1.2.2 පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා රහිත වෛද්‍ය නිලධාරීන් උසස් කිරීම

සපුරාලිය යුතු සුදුසුකම්.

I. සේවය ස්ථිර කර තිබීම
II. සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර දොළහක (12) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත කාලය තුළදී වැටුප් වර්ධක දොළහක් (12) උපයාගෙන තිබීම.
III. පූර්වාසන්න වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම
V. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබා ගෙන තිබීම

10.2 දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් වීම : II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා සහිත දන්ත වෛද්‍ය නිලධාරීන් උසස් කිරීම

සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවය ස්ථිර කර තිබීම
II. සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර නවයක(09) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම නියමිත කාලය තුලදී වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබීම.
III. පූර්වාසන්න වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. සේවා ව්‍යවස්ථාවේ I හා II පරිශිෂ්ඨයේ සඳහන් සුදුසුකම් ; පශ්චාත් උපාධි සුදුසුකම් සාර්ථකව සපු තිබීම
V. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම
VI. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුලදී ලබා ගෙන තිබීම

10.2.2 පශ්චාත් උපාධි/ඩිප්ලෝමා රහිත දන්ත වෛද්‍ය නිලධාරීන් උසස් කිරීම

සපුරාලිය යුතු සුදුසුකම්.

I. සේවය ස්ථිර කර තිබීම
II. සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර පහළොවක(15) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම නියමිත කාලය තුලදී වැටුප් වර්ධක පහළොවක් (15) උපයාගෙන තිබීම.
III. පූර්වාසන්න වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම
V. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුලදී ලබා ගෙන තිබීම

10.3 උසස්වීම් ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් ක ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ශ්‍රේණියට උ කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. උසස් වීම් මත තනතුරුවලට පත් කිරීම

11.1 වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පත්වීම

11.1.1 වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරුවලට අදාළ පත්වීම් සම්බන්ධයෙන් පොදු මාර්ගෝපදේශයන්.

1. රාජ්‍ය සේවා කොමිසම් සභාව විසින් අනුමත කරන ලද ලකුණු පටිපාටියට අනුව වෛද්‍ය පරිපා ශ්‍රේණියට පත්වීම් කරනු ලැබේ.

2. සුදුසුකම් ලත් නිලධාරීන්ට අයදුම් කළ හැකිවන පරිද්දෙන් වාර්ෂික ස්ථාන මාරු ලැයිස්තු මගින් ෙ තනතුරු වල ඇතිවන පුරප්පාඩු ප්‍රකාශයට පත් කරනු ලැබේ.

3. පුරප්පාඩු වූ තනතුරක් පිළිබඳව දන්වන විට එකී දැන්වීමෙහි තනතුරේ රැකියා විස්තරය ඇතුළත් යුතුය.

4. මෙම සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් කරන ලද අනිවාර්ය සුදුසුකම්වලට අදාළ වන විධිවි 2007-04-16 දිනැති අංක 1493/3 දරණ ගැසට් නිවේදනය ක්‍රියාත්මක කිරීමෙන් පෙර බඳවාගත් නිලධාරී බලපෑම් ඇති නොවිය යුතුය.

5. වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට තෝරා ගනු ලබන කිසිදු නිලධරයෙක් හට පුද්ගලික වෛද්‍ය සේව යෙදීමට අවසර නැත්තේය.

6. III හා IV පරිශිෂ්ඨයන්හි උපලේඛනය තුළ පළාත් යටතට ගැනෙනා නව තනතුරු පිළිබඳව දැන්වීම් පළ කිරීමට ප්‍රථම පළාත් අධිකාරිය හෝ ආණ්ඩුකාරවරයාගේ එකඟතාව ලබා ගැනීම අවශ්‍ය වන අතර එකී තනතුරු සඳහා වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට තනතුරේ විෂයට අදාළ පළාතෙහි නියෝජිතයන් දෙදෙනෙකු ඇතුළත් විය යුතුය.

7. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම් (වෛද්‍ය සේවා/මහජන සෞඛ්‍ය සේවා), අතිරේක ලේකම් (පරිපාලන), සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ශ්‍රී.ලං.ප.සේ. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා අදාළ පළාත් අධිකාරීන් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත පූර්ව නිශ්චිත කමිටු සාමාජික සංචිතයකින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තෝරාගත යුතු අතර, සෑම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් සඳහාම රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලබා ගත යුතුය

8. අතුරු විධිවිධානය

(i) පත්වීම්, උසස්වීම් හා ස්ථාන මාරු සඳහා වන මෙම පටිපාටිය ක්‍රියාත්මක වීමත් සමග 2007-04-16 දිනැති අංක 1493/3 දරන ගැසට් නිවේදනය ක්‍රියාත්මක වන විට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේනියේ සිටි නිලධාරීන් තමන් ඒ වන විට දරන ලද තනතුරු නොසලකා ඔවුන් සිටින ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේම රැඳී සිටිය යුතු ය. තවද මෙම සේවා ව්‍යවස්ථාවෙහි පරිශිෂ්ඨ I හා IV හි සඳහන් කර ඇති ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරු සඳහා නියම කෙරුණු අනිවාර්ය සුදුසුකම් හා රජය මගින් කලින් කලට ඇති කරනු ලබන කවර හෝ නව තනතුරක් සඳහා ඇති අනිවාර්ය සුදුසුකම 2007-04-16 දිනැති අංක 1493/3 දරන ගැසට් නිවේදනය ක්‍රියාත්මක වන විට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියෙහි සිටි නිලධාරීන් හට අදාළ නොවේ. එහෙයින් විශ්‍රාම යනතුරු පත්වීම්, ස්ථාන මාරු හා උසස්වීම් වලට අදාළව කවර තනතුරකට වුව අයදුම් කිරීමට ඔවුනට නිදහස තිබේ.

(ii) මෙම සේවා ව්‍යවස්ථාවෙහි III, IV හා V පරිශිෂ්ඨයෙහි නව තනතුරු සම්බන්ධයෙන් ගත් කළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඒවා පිරවීමට කටයුතු කළ යුතු අතර අදාළ විධිවිධානයන්හි අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසුව ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතුය.

11.1.2 වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරුවලට පත්වීමට අදාළ සුදුසුකම් හා තෝරා ගැනීමේ පටිපාටිය.

*තනතුර/ශ්‍රේණිය* *(අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.*

| | |
|---|---|
| 11.1.2 .1 නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය. | |
| නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය. | අ. වෛද්‍ය සේවා ව්‍යවස්ථාවෙහි පරිශිෂ්ඨ I හා II හි ලැයිස්තුගත කරන ලද පශ්චාත් උපාධි සුදුසුකම් සහිත නිලධාරීන් III පරිශිෂ්ඨයෙහි සඳහන් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණි තනතුරු සඳහා අයදුම් කිරීමට හිමිකම් ලබයි.<br><br>ආ. දෙපාර්තමේන්තුවෙහි වසර 8ක අඛණ්ඩ සේවයක් සහිත (වසර 8ක කාලය ගණනය කරනු ලබන්නේ ප්‍රාථමික ශ්‍රේණියට ඇතුලත් වූ දින සිටය) II ශ්‍රේණියෙහි උසස් වීම් ලද කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු/විශේෂඥ වෛද්‍ය නිලධාරියකු වීම.<br><br>ඇ. නිලධාරියකු, නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරක වැඩ බලන /රාජකාරී ඉටුකරන සේවා කාලය අතිරේක සුදුසුකමක් ලෙස සැලකිය යුතුය. කෙසේ වුවද එකී පත් කිරීම් නියමිත පත්වීම් බලධරයා විසින් කරන ලද පත්වීමක් විය යුතුය.<br><br>ඇ.වයස් සීමාව: සියළුම නිලධාරීන් දැනටමත් රාජ්‍ය සේවයේ සිටින්නන් වන හෙයින් උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

| තනතුර/ශ්‍රේණිය | (ආ) තේරීම් පටිපාටිය |
| --- | --- |
| | I. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පුරප්පාඩු වූ තනතුරු එකී ශ්‍රේණි යෙහි සිටිනා නිලධාරීන් අතරින් කෙරෙනා වාර්ෂික ස්ථාන මාරු මගින් පුරවනු ලැබේ.<br><br>II. වාර්ෂික ස්ථාන මාරු මගින් තනතුරක පුරප්පාඩුව පිරවිය නොහැකි අවස්ථා වලදී එය ප්‍රසිද්ධ කරනු ලබන අතර රාජ්‍ය සේවා කොමිසම මගින් අනුමත කරන ලකුණු ක්‍රමයක් මත පදනම්ව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් තුළින්, සුදුසුකම් සපුරාලන නිලධාරීන් අතරින් පුරවනු ලැබේ.<br><br>III. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන සේවයේ තනතුරුවලට තෝරාගැනීම රාජ්‍ය සේවා කොමිසම විසින් අනුමත ලකුණු ක්‍රමයක් මත පදනම්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යටත්ව සිදු කළ යුතුය. ලකුණු ලබා දීමේදී I ශ්‍රේණියේ හා II ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාව තීරනායකයක් සේ සැලකේ.<br><br>සටහන 5 : වාර්ෂික ස්ථාන මාරු මගින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන තෙක් පත්වීම් බලධරයා හට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත හා දැනටමත් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන සේවයෙහි සිටින නිලධාරීන් අතුරින් වැඩ බැලීමේ පදනම මත පත්වීම් සිදු කළ හැකිය.<br><br>සටහන 6 : නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණි යනු එකී ශ්‍රේණියේ ස්ථාන මාරුවීම් පටිපාටිය ක්‍රියාත්මක වනතුරු නව ශ්‍රේණියක් වන හෙයින් පුරප්පාඩු පිරවිය යුත්තේ 11.12.1 ආ (1) හා : II)හි සඳහන් කර ඇති පරිදි දැන්වීම් මගිනි) |

| තනතුර/ශ්‍රේණිය | (අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
| --- | --- |
| 11.1.2.2ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය | I. වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨ I හා II හි ලැයිස්තුගත කරන ලද විද්‍යාපති/වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන) උපාධියක් හෝ විද්‍යාපති/වෛද්‍ය විශාරද(ප්‍රජා වෛද්‍ය)උපාධිය ලබා ඇති වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙ රාජ්‍ය සේවා කොමිසම විසින් අනුමත කරන ලද ලකුණු ක්‍රමය මත පදනම්ව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක යටත්ව ජ්‍යෙෂ්ඨ පරිපාලන ශ්‍රේණියේ තනතුරකට පත්කර ලැබීමට හිමිකම් ලබයි.<br><br>II. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 3 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>III. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය යටතට ගැනෙනා සමා තනතුරු පරිශිෂ්ඨ IV හි ඇතුළත් කෙරෙන අතර සේවා අවශ්‍ය මත වරින් වර නිර්මාණය කරනු ලබන කවර තනතුරක් වුව ඊ ඇතුලත් කෙරේ.<br><br>සටහන 7 : ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය යටතට ගැනෙන සෑම තනතුරක් සඳහා වන අනිවාර්ය සුදුසුකම් IV පරිශිෂ්ඨයෙ සඳහන් සුදුසුකම් විය යුතු අතර මෙකී තනතුරු සමාන තනතු සේ සැලකිය යුතුය. |

| තනතුර/ශ්‍රේණිය | (ආ) තෝරීම් පටිපාටිය |
|---|---|
| | IV. එකී තනතුරු සඳහා අයදුම් පත්‍ර කැඳවීමේදී අයදුම්කරුවන් IV පරිශිෂ්ඨයේ ලැයිස්තුගත කර ඇති අදාළ අනිවාර්ය පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබිය යුතුය. කෙසේ වුවද 2007-04-16 දිනැති අංක 1493/3 දරණ ගැසට් නිවේදනය ක්‍රියාත්මක වන විට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන තනතුරුවල සිටින නිලධාරීන්ට මෙම අනිවාර්ය සුදුසුකම් අදාළ නොවේ.<br><br>V. නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරක වැඩ බලන/රාජකාරී ඉටු කරන සේවා කාලය අතිරේක සුදුසුකමක් ලෙස සැලකිය යුතුය. කෙසේ වුවද එකී පත්කිරීම්, නියමිත පත්වීම් බලධරයා විසින් කරන ලද පත්වීමක් විය යුතුය.<br><br>VI. වයස් සීමාව : සියළුම නිලධාරීන් දැනටමත් රාජ්‍ය සේවයේ සිටින බැවින් උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

| තනතුර/ශ්‍රේණිය | (ආ) තෝරීම් පටිපාටිය |
|---|---|
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය | I. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පුරප්පාඩු ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු මගින් පුරවනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු මගින් තනතුරක පුරප්පාඩුව පිරවිය නොහැකි අවස්ථාවලදී එය ප්‍රසිද්ධ කරනු ලබන අතර සේවා පළපුරුද්ද හා කුසලතාවය මත පදනම්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු පටිපාටියක් මත පදනම්ව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පුරප්පාඩු පුරවනු ලැබේ.<br><br>II. වාර්ෂික ස්ථාන මාරු මගින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන තෙක් පත්වීම් බලධරයා හට එකී තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත හා දැනටමත් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ සිටින නිලධාරීන් අතරින් වැඩ බැලීමේ පදනම මත පත්වීම් සිදු කළ හැකිය. |

| තනතුර/ශ්‍රේණිය | (අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|
| 1.12.3 නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය | I. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් හා දන්ත ශල්‍ය වෛද්‍යවරුන් රාජ්‍ය සේවා කොමිසම මගින් අනුමත කරන ලකුණු ක්‍රමයක් මත පදනම්ව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යටත්ව V පරිශිෂ්ඨයේ සඳහන් තනතුරු සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණි නිලධාරීන් ලෙස පත් කිරීමට සුදුසු වේ.<br><br>II. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය යටතට ගැනෙන තනතුරු V පරිශිෂ්ඨයේ දැක්වෙන අතර සේවා අවශ්‍යතාවයන් ප්‍රකාරව කලින් කලට ඇති කරන ඕනෑම තනතුරක් ඊට ඇතුළත් වේ.<br><br>III. අයදුම්කරු මෙහි පරිශිෂ්ඨයෙහි ඉල්ලා සිටින පරිදි වෛද්‍ය සේවා ව්‍යවස්ථාවෙහි I හා II පරිශිෂ්ඨයන්හි ලැයිස්තුගත කර ඇති වෛද්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති /වෛද්‍ය විශාරද උපාධිය හෝ ප්‍රජා වෛද්‍ය විද්‍යාපති / වෛද්‍ය විශාරද උපාධිය ලැබ සිටිය යුතුය. |

| තනතුර/ශ්‍රේණිය | (අ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|
| | සටහන 8 : ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව විශේෂ කත්වයන් ලෙස සලකා V පරිශිෂ්ඨයෙහි දක්වා ඇති පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/දන්ත වෛද්‍ය සේවා තනතුර සඳහා සුදුසුකම් ලෙස ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාපති / වෛද්‍ය විශාරද උපාධිය සුදුසුකමක් සේ සැලකේ.<br><br>සටහන 9: කෙසේ වුවද දැනටමත් ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන නිලධාරීන් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු දරණ නිලධාරීන්ට මෙම අනිවාර්ය සුදුසුකම් අදාළ නොවේ. ඔවුන්ට තම වර්තමාන තනතුරු දැරිය හැකි අතර අනිවාර්ය සුදුසුකම නොසලකා ඔවුන් V පරිශිෂ්ඨය යටතට ගැනෙන අන් කවර තනතුරකට වුව පත්කළ හැකිය.<br><br>IV. වයස් සීමාව: සියළුම නිලධාරීන් දැනටමත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් බැවින් වයස් සීමාව අදාළ නොවේ.<br><br>V. මෙම ශ්‍රේණියට අදාළ උසස්වීම් පටිපාටියක් නොමැත.<br><br>VI. මෙම ව්‍යවස්ථාවෙහි 11.1.1 වගන්තිය යටතේ වන පත්වීම්වල ට අදාළ පොදු මාර්ගෝපදේශයන් අවශ්‍යතාවය පරිදි අදාළ කරග යුතුය.<br><br>VII. ස්ථාන මාරු V පරිශිෂ්ඨයේ සඳහන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය යටතට ගැනෙන සියළුම තනතුරු අවසන් තනතුරු වන අතර ස්ථාන මාරුවලට යටත් නොවේ. |

| තනතුර/ශ්‍රේණිය | (ආ) තෝරීම් පටිපාටිය |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය | I. ගැසට් නිවේදනයක් හෝ පුවත්පත් දැන්වීමක් හෝ දෙපාර්තමේන්තු චක්‍රලේඛයක් මගින් පුරප්පාඩු ප්‍රසිද්ධ කර සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු පටිපාටියක් මත පදනම්ව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් තුළින් එම පුරප්පාඩු පුරවනු ලැබේ.<br><br>සටහන 10 : මෙම ශ්‍රේණියේ තනතුරු සඳහා ස්ථාන මාරු නොමැති බැවින් පුරප්පාඩු වූ තනතුරක් සඳහා පුරප්පාඩුව පුරවන තෙක් පත්වීම් බලධරයා හට එකී තනතුරට අවශ්‍ය සුදුසුකම් සහිත හ දැනටමත් ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියේ සිටින නිලධාරීන් අතරින් වැඩ බැලීම් පදනම මත පත්වීම් සිදු කළ හැකිය.<br><br>සටහන 11. කෙසේ වුවද වැඩ බැලීමේ පත්වීම නිසි පත්වීම් බලධරය විසින් නියමිත පරිදි අනුමත කළ යුතුය. |

11.2 විශේෂඥ වෛද්‍ය නිලධාරී ශ්‍රේණියේ පත්වීම්.

11.2.1 විශේෂඥ වෛද්‍ය නිලධාරී ශ්‍රේණියේ සුදුසුකම් හා තෝරා ගැනීමේ පටිපාටිය.

| තනතුර/ශ්‍රේණිය | (අ) අධ්‍යාපන හා අනෙක් සුදුසුකම් |
|---|---|
| විශේෂඥ වෛද්‍ය නිලධාරී ශ්‍රේණිය | I. අංක 14840 හා 1969 පෙබරවාරි 07 දරන රජයේ ගැසට් නිවේදනය ප්‍රකාර වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ I පරිශිෂ්ඨයේ ලැයිස්තුගත කර ඇති සුදුසුකම් සහිත හා 1980-01-01 දිනට පෙර විශේෂඥ තනතුරු වලට පත් කරන ලද වෛද්‍ය නිලධාරීන්,විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ලෙස අඛණ්ඩව පිළිගත යුතුය.<br><br>II. අංක 14840 හා 1969 පෙබරවාරි 07 දරන රජයේ ගැසට් නිවේදනය ප්‍රකාර වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ 1 පරිශිෂ්ඨයේ ලැයිස්තුගත කර ඇති සුදුසුකම් ලබා ඇති හා 1980-01-01 දින හෝ ඊට පසු දෙපාර්තමේන්තුවට පත් කරන ලද, කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයෙහි සුදුසුකම් සපුරා ඇති හා මණ්ඩලයේ සහතිකය ලබා ඇති වෛද්‍ය නිලධාරීහු විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ලෙස පත් කරනු ලැබීමට හිමිකම් ලබති.<br><br>III. අංක 14840 හා 1969 පෙබරවාරි 07 දරන රජයේ ගැසට් නිවේදනය ප්‍රකාර වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ 1 පරිශිෂ්ඨයේ ලැයිස්තුගත කර ඇති සුදුසුකම් ලබා ඇති හා 1980-01-01 දිනට පෙර විශේෂඥ තනතුරුවලට පත් කරන ලද හෝ දෙපාර්තමේන්තුව මගින් අනුමත කරනු ලබන වැටුප් රහිත නිවාඩු ලැබ හෝ ශිෂ්‍යත්ව ලැබ ගොස් 1980-01-01 දිනට පසු නියමිත කාලය තුළ ආපසු පැමිණ ඇති වෛද්‍ය නිලධාරීහු විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ලෙස පත් කරනු ලැබීමට හිමිකම් ලබති.<br><br>IV. යෝග්‍ය පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කිරීම මත කොළඹ විශ්ව විද්‍යාලයෙහි පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ මණ්ඩල සහතිකය ලබා ඇති හා I පරිශිෂ්ඨයෙහි ලැයිස්තුගත කර ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති II ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීහු විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ලෙස පත්වීම් ලැබීමට සුදුසුකම් ලබති.<br><br>V. උක්ත II උප වගන්තිය පරිදි 1980-01-01 දිනට පසුව පත් කරන ලද විශේෂඥ වෛද්‍ය නිලධාරීන් මණ්ඩල සහතිකය ලත් දින සිට වසර හතරක සේවා කාලයක් සම්පූර්ණ කරන තෙක් ශික්ෂණ රෝහලකට පත් කිරීම සඳහා සලකා බලනු නොලැබේ.<br><br>VI. උක්ත II හා IV උප වගන්ති පරිදි පත් කරන ලද විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ට මණ්ඩල සහතිකය ලත් දින සිට විශේෂඥ වැටුප ගෙවනු ලැබේ.<br><br>සටහන 12. විශේෂඥ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහාද උක්ත I සිට VI දක්වා වන උප වගන්ති අදාළ වේ. |

67



| තනතුර/ශ්‍රේණිය | (ආ) තෝරාගැනීමේ පටිපාටිය |
|---|---|
| විශේෂඥ වෛද්‍ය නිලධාරී ශ්‍රේණිය | විශේෂඥ තනතුරු සඳහා අයදුම් කිරීම : විශේෂඥ තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලබන්නේ විශේෂඥ වෛද්‍යවරුන්/විශේෂඥ දන්ත වෛද්‍යවරුන් ලෙස මණ්ඩල සහතිකය ලබා ඇති අයගෙන් පමණි. පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ මණ්ඩල සහතිකය අපේක්ෂාවෙන් සිටිමින් සුදුසුකම් ඉදිරිපත් කරන කිසිවෙකු වෙතින් අයදුම්පත් කැඳවනු හෝ භාරගනු නොලැබේ. |

12. සේවයට අදාළ පොදු කොන්දේසි.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලබන සියළුම වෛද්‍ය නිලධාරීන් සහ දන්ත වෛද්‍ය නිලධාරීන් වසර 03ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

12.1 සේවා ස්ථිරත්වය සඳහා සුදුසුකම්.

- පරිවාස කාලය සාර්ථකව සම්පූර්ණ කර තිබීම.
- කාර්යක්ෂමතා කඩඉම් විභාගය සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

12.2 පුහුණුව හා සංවර්ධනය.

I. මූලික වෛද්‍ය පුහුණුව සඳහා වන අනිවාර්යයීමාවාසික කාල පරිච්ඡේදය
II. අඛණ්ඩ වෛද්‍ය අධ්‍යාපනය සඳහා වන සේවාස්ථ පුහුණු
III. පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය හරහා වෘත්තියමය සංවර්ධනය
IV. විශේෂඥතාවය සඳහා වූ සුවිශේෂී පශ්චාත් උපාධි විභාග.

පශ්චාත් උපාධි විභාග

